# නැවතත් ඉංගිරිසියට යෑමට වළිකෑම

මෙරට සියළු ප්‍රශ්නවලට මුල සිංහලෙන් හා දෙමළෙන් උසස් අධ්‍යාපනය ලබාදීම යැයි කියනු බොහෝ විට අසන්නට ලැබෙයි. සිංහල හා දෙමළ භාෂාවලින් ඉගැන්වීම ආරම්භ කෙරුණේ කන්නන්ගර මහතාගේ කාලයේ වුව ද 1956 ඇති වැදගත්කම නිසා ද සියළු ප්‍රශ්නවල පිටුපස 1956 ඇතැයි කීමට අවශ්‍ය නිසා ද උසස් අධ්‍යාපනය සිංහලෙන් හා දෙමළෙන් ලබාදීම ද 1956ට ම බැරකිරීමට ඇතැමුන්ට අවශ්‍ය වෙයි. ඒ ගෞරවයක් දීම සඳහා නොවන බව ද පැහැදිලි ය.

මේ රටේ ප්‍රශ්නවලට මුල 1956 නොව 1956 හරියට ක්‍රියාත්මකකිරීමට නො හැකිවීම ය. ඒ වෙනම සාකච්ඡාකළ යුතු ප්‍රශ්නයක් වෙයි. කෙසේ වෙතත් උසස් අධ්‍යාපනය ඉංගිරිසියෙන් ලබා නොදීම නිසා ඇති වී තිබෙන්නේ යැයි කියන දුර්වලකම් නැතිකිරීමට කොළඹ විශ්වවිද්‍යාලයෙහි ශාස්ත්‍ර පීඨය සූදානම්වන බවක් පසුගිය දා ආණ්ඩුවේ ජනමාධ්‍ය විසින් ප්‍රකාශ කෙරිණි. ආණ්ඩුවේ ජනමාධ්‍යයට අනුව උක්ත පීඨය ඉංගිරිසියෙන් පමණක් ඉගැන්වීමට දැනටමත් තීරණයක් ගෙන ඇත. මේ පිළිබඳ ශ්තෝත්‍ර ගායනා කළෝ ද ආණ්ඩුවේ ජනමාධ්‍යවල වූහ. එක් අයකු ඒ ගැන උදම් අනමින් අදාළ පීඨයේ ප්‍රබුද්ධ යැයි සම්මත ඊනියා වාමාංශික අදහස් දරන්නේ යැයි කියන ඇදුරන් කිහිප දෙනකුට සියළු බාධක හමුවෙහි තීරණය ක්‍රියාත්මක කිරීමට පෙරට එන ලෙස ද ආරාධනය කර තිබුණි. මේ ලිපිය ලියු තැනැත්තා ද ඒ පීඨයෙන් ම සිංහල මාධ්‍යයෙන් උපාධියක් ලබාගැනීමත්, අර ඇදුරන්ගෙන් ඇතමකු ද තම ප්‍රථම උපාධිය සිංහලෙන් නිමකිරීමත් මෙහි දී කැපී පෙනෙන කරුණු වෙයි. ඒ ලේඛකයා මෙන් ම ඒ ඇදුරන් ද මම හඳුනමි. ඔවුන් මට වඩා හොඳින් ඉංගිරිසි බස දන්නවා විය හැකි ය. එහෙත් මේ එක් අයකුවත් නිර්මානය කළ ප්‍රවාදයක් සංකල්පයක් ගැන මම නො දනිමි. ඔවුහු අංක එකේ ඇංකරයෝ වෙති. ඔවුන්ට එසේ කීම බුද්ධිමතකුගේ ලක්ෂණයක් නොවේ යැයි කිසිවකු කීමට ඉඩ ඇත. ප්‍රබුද්ධයන්ගේ මිම්ම අනුව මා කිසි දිනක බුද්ධිමතකු නොවූ බැවින් ඒ මට ප්‍රශ්නයක් නො වෙයි.

කොළඹ විශ්වවිද්‍යාලයෙහි ශාස්ත්‍ර පීඨය එවැනි තීරණයක් ගත්තේ දැයි කීමට මම නො දනිමි. තීරණය ගත්බව කියන්නේ ආණ්ඩුවේ ජනමාධ්‍යය යි. ආණ්ඩුව යනු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ පමණක් නොව ශ්‍රී ල නි පක්ෂයේ ද, ජ වි පෙරමුණේ ද, ම ඒ පෙරමුණේ ද තවත් පක්ෂවල ද ආණ්ඩුවක් වෙයි. එහෙත් ජනාධිපතිනියගේ අනුග්‍රහය හේතුවෙන් ජනමාධ්‍යවල තනතුරුවලට පමණක් නොව, අමාත්‍යාංශවල ලේකම් පදවිවලට ද පත් වී ඇති මහත්ම මහත්මීන් සිතන්නේ මේ චන්ද්‍රිකාගේ ආණ්ඩුවක් කියා ය. ඔවුහු ඊනියා ජාතික ප්‍රතිපත්ති නමින් තම පෞද්ගලික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වෙර දරති. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය යනු රටේ අභාග්‍යයට, එහෙත් රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරයෙන් ඉවත් කරතැබීම යන එකම එක යහපත් කරුණ සඳහා, ජනාධිපති පදවියට පත් වූ කාන්තාවක් වෙයි. තම දෙමව්පියන් අගමැතිවරුන් නොවන්නට සම්ම ජාතියේ ජනාධිපති වීමේ හැකිකමක් නොමැති ඇය සියල්ල කරන්නේ විජාතික බලවේගවල අවශ්‍යතාව පරිදි 1956 දී දිනාගත් හෝ පෙරට ගෙනගිය හෝ යමක් ඇත්නම් ඒ දියකර හැරීමට ය. ඒ සඳහා අවශ්‍ය පුද්ගලයන් ද ඇය විසින් තනතුරුවලට, විශේෂයෙන් ම අමාත්‍යාංශ ලේකම් පදවිවලට, පත්කෙරී ඇත.

අප පළමුවෙන් ම නිශ්චිත ව ම දැනගත යුත්තේ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය එවැනි තීරණයක් ගෙන ඇත් ද යන්න ය. බොහෝ අවස්ථාවල කෙරෙන්නේ අමාත්‍යාංශ ලේකම්වරු (ලේකම්වරියන් ද ඇතුළත් වන බව සලකන්න), ප්‍රතිපාදන කොමිසම සහ වෙනත් බලධාරීන් ආදීන් තීරණ ගෙන, ඒ අදාළ පීඨ මඟින් ගත් තීරණ ලෙස සැලකෙන්නට ඉඩ හැරීම ය. මෙය ක්‍රම කිහිපයකට සිදුවිය හැකි ය. ඇතැම් විට බලධාරීන් දෙන අදහසක් ක්‍රියාත්මක කිරීමට පීඨයක් තීරණය කරනු ඇත. ඒ සාධාරණීකරනය සඳහා, අදහස විශ්ලේෂණයට හා විචාරයට ලක්කිරීමෙන් පසුව ඒ පිළිගත්තේ යැයි කීමට ද බැරිකමක් නැත. එහෙත් විශ්වවිද්‍යාලවල තීරණ ගැනීමේ දී ඒ එසේම සිදු නොවන බව මගේ පෞද්ගලික අත්දැකීම වෙයි. ඉංගිරිසියෙන් ඉගෙනගෙන තිබුණ ද සිංහලෙන් ඉගෙනගෙන තිබුණ ද ඉංගිරිසියෙන් හෝ සිංහලෙන් හෝ කොඳු නාරටි නිර්මානය කළ හැකි නො වෙයි.

© Prof. Nalin De Silva

ඉංගිරිසියෙන් උසස් අධ්‍යාපනය ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ වර්තමාන ලේකම්වරිය මහත්සේ වලිකන බව බොහෝ දෙනා දනිති. විශ්ව විද්‍යාලවල පමණක් නොව උසස් පෙළ ද අඩුම තරමින් විද්‍යා විෂය ඉංගිරිසියෙන් ඉගැන්වීමට ඇය විශේෂ මහන්සියක් දරණ බව ද නො රහසකි. මේ කුමක් සඳහාදැයි ඇය නො කියයි. ඉංගිරිසියෙන් විද්‍යා පොතපත තිබෙන බව සත්‍යයකි. එහෙත් ඉගැන්විය යුත්තේ පොතපත තිබෙන බසකින් පමණක් යැයි කියන්නේ මොන අධ්‍යාපන විශේෂඥයා ද? ඇතැම්විට බටහිර අධ්‍යාපනවේදියකු ඒ සඳහා ප්‍රවාදයක් නිර්මාණය කිරීමට ද හැකි ය. එහෙත් බටහිර ප්‍රවාදයක් නිර්මානයකර තිබූ පමණින් එය පිළිගැනීම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියට හා ඕල්කට් බෞද්ධ සංස්කෘතියට එකඟ වුවත් සිංහල බෞද්ධ සංස්කෘතියට එකඟ නො වෙයි. ඉගැන්විය යුත්තේ පොතපත තිබෙන බසකින් නොව ශිෂ්‍යයන්ට තේරෙන බසකින් ය. ගුරුවරුන්ට ද ඒ බසින් හොඳින් ඉගැන්විය හැකිනම් වඩාත් හොඳ ය. ගුරුවරුන්ට ඒ බසින් ඉගැන්විය නොහැකි නම් කළ යුත්තේ ඔවුන්ට ඒ බස ඉගැන්වීම ය. දෙවනුව ඉගැන්විය යුත්තේ අදාළ ශිෂ්‍යයාගේ සංස්කෘතියට අදාළ බසින් ය. බසක් යනු හුදු සන්නිවේදන මාධ්‍යයක් පමණක් නො වෙයි. ඒ සංස්කෘතික මෙවලමක් වෙයි. ඇතැම් විට සංස්කෘතික ආධිපත්‍යය පැටවීමට යොදාගන්නක් වෙයි. ඉංගිරිසියෙන් අධ්‍යාපනය ලබාදීම පිටුපස ඇත්තේ වෙනත් කිසිවක් නොව ඉංගිරිසි ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය තව තවත් තහවුරු කිරීම ය. මෙරට අද පවතින අර්බුදයට එක් අතකින් වගකිවයුත්තෝ ඊනියා ද්විභාෂික උගත්තු වෙති. ඔවුන් කෙළේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සිංහලෙන් කියා සිංහල පමණක් දත්තවුන් ද අනුකාරකයන් බවට පත්කිරීම ය. හැටගණන්වල සිදුවූයේ සිංහල සාහිත්‍යයේ වර්ධනයක් නොව අනුකාරක සාහිත්‍යයක් බිහිකිරීම ය.

ශිෂ්‍යයකු ලෙස ද ගුරුවරයකු ලෙස ද මට කිව හැක්කේ මට හොඳින් ම වැටහෙන්නේ යමක් සිංහලෙන් කී විට බව හා මට හොඳින්ම ඉගැන්විය හැක්කේ සිංහලෙන් බව ය. අර පුවත්පත් ලේඛකයාට හා ඔහුගෙන් සහතික ලත් ඇදුරන්ට කෙසේ වෙතත් මට හොඳින් වැටහෙන්නේ සිංහල ව්‍යංගාර්ථ හා ධ්වනිතාර්ථ මිස ඉංගිරිසි ඉඩියම නො වෙයි. ඒ සියල්ලටත් වඩා මට නිර්මාන කළහැක්කේ සිංහලෙන් ය. විශ්වයේ ප්‍රසාරණය ත්වරණයකින් සිදුවීම පිළිබඳ මේ දිනවල අපි කැලණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යයනයක් කරන්නෙමු. මේ පිළිබඳ මා මුළුමනින් ම සිතන්නේ සිංහලෙන් ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි පදනම් වෙමින් ය. මගේ පශ්චාත් උපාධි සිසුන් සමග මා සියළු සාකච්ඡා කරන්නේ මුළුමනින් ම සිංහලෙන් ය. මා ඔවුන්ට උගන්වන්නේ සිංහලෙන් ය. එහි දී වාසනාවකට දේශන පැවැත්වීමේ අවශ්‍යතාවක් නැත. එසේ වී නම් දේශන ඉංගිරිසියෙන් පැවැත්වීමට බල කෙරීමට තිබුණි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි පදනම් වෙමින් සිංහලෙන් සිතා සිංහලෙන් උගන්වා සිංහලෙන් සාකච්ඡාකර නිර්මානය කෙරෙන ඒ ප්‍රවාද අවශ්‍ය වූ විටක ඉංගිරිසියෙන් ප්‍රකාශකිරීමේ හැකියාව අපට ඇත. පසුගිය දා ඈ ඒ ජනපදයේ විශ්වවිද්‍යාලයක දී අපි එසේ කෙළෙමු. සිංහලෙන් නිර්මානය වූ ඒ ප්‍රවාදය වැඩකට නැති එකක් යැයි එතැන සිටි කිසිවකු පසුවවත් කී බවක් දැනගැනීමට නැත. ඔවුන් ඒ වෙනුවට කීවේ හැකි ඉක්මණින් එය පළකරන ලෙස ය. මා ඔවුන්ට කියා සිටියේ දැනටමත් එය කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සැසිවාරවල සාරාංශ ලෙස පළ වී ඇති බව ය.

බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මානය කෙරෙන වර්තමාන බටහිර දැනුම අනුව අද කෙරෙන්නේ සාමාන්‍යකරණයකි. වියුක්ත ප්‍රවාද මගින් දැනුම නිර්මානය කෙරෙයි. දැනුම යනු නිර්මානය කෙරෙන්නක් බවට බටහිර ඇතැම් සමාජ විද්‍යාඥයන් ද පවසන බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමිය දන්නවා වියහැකි ය. ඒ කෙසේ වෙතත් සිංහල බෞද්ධ සංස්කෘතියට අනුව මනස ද ඇතුළු සියල්ල මනසින් නිර්මානය කෙරෙයි. ඒ වාක්‍යය ඉවසිල්ලෙන් කියවූ කිසිවකු යුදෙව් ක්‍රිස්තියානි ප්‍රවාදවල එල්ලී සිංහල බෞද්ධයන්ට විඥානවාදීන් යැයි ගැරහීමට ඉදිරිපත් නොවනු ඇත. බටහිර නූතනත්වයේ වියුක්ත සාමන්‍යකරණයට හුරුකර ඇති උගතුන්ට සංයුක්ත ශිෂ්‍යයෝ නො වෙති. මේ උගතුන්ට ඇත්තේ වියුක්ත ශිෂ්‍යයකු පමණ ය. ඔවුන් සිතන්නේ වියුක්ත ශිෂ්‍යයාගේ ඉගෙන ගැනීමේ මාධ්‍යය සිංහලෙන් හෝ දෙමළෙන් ඉංගිරිසියට හැරවීම ගැන පමණකි. ලේ මස් ඇට සහිත සංයුක්ත ශිෂ්‍යයන් ගැන ඔවුහු නො දනිති. මේ ශිෂ්‍යයන්ට ඉගැන්විය යුත්තේ සිංහලෙන් හෝ දෙමළෙන් හෝ බව ඔවුන්ට නො තේරෙයි. ඔවුන්ට ඉංගිරිසියෙන් ඉගැන්විය යුත්තේ ඇයිදැයි කිසිවකුට හෝ කිවහැකි ද?

අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්තුමිය පැමිනෙන්නේ නම් මේ සමස්ත ප්‍රශ්නය පිළිබඳ එක්දින වැඩමුළුවක් කැලණිය විශ්ව විද්‍යාලයේ විමංසක පර්ෂදය මගින් සංවිධානය කළ හැකි ය. ඇයට එයට සහභාගි වී තම අදහස් අවශ්‍ය නම් ඉංගිරිසියෙන් ම ප්‍රකාශකළ හැකි ය. එහෙත් ඇය අප සිංහලෙන් කියන්න ද අසන්නට සූදානමින් පැමිණිය යුතු ය.

© Prof. Nalin De Silva